මගේ අංකය : **TF/AD/9/06**
2026-03-05දින.

<u>**ඡායාරූප ලබා ගැනීම**</u>

ටවර් හෝල් රඟහල පදනමට අයත් දමිළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසලේ දෙවර්ෂ පූර්ණකාලීන නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාවෙහි 2022/23 අධ්‍යයන වර්ෂයේ ඩිප්ලෝමා සමර්පණෝත්සවය වර්ෂ 2026 මාර්තු මස 24 වන දින යාපනයේ ඉන්දියන් සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර එහි ඡායාරූප පහත පරිදි ලබා ගත යුතුව ඇත.

| විස්තරය | ඡායාරූපයේ ප්‍රමාණය |
|---|---|
| 01.සිසුන්ගේ සමූහ ඡායාරූපය (සිසුන්-49) | 10 x 15 inch |
| 02.සිසුන් ඩිප්ලෝමා සහතිකය ලබා ගන්නා ඡායාරූපය (සිසුන් -49) | 8x12 inch |

03.සම්පූර්ණ වැඩ සටහන ආවරණය පරිදි ඡායාරූපගත කර එහි ඩිජිටල් පිටපත්-01

උක්ත සඳහන් පිරිවිතරවලට අනුව ඡායාරූප ගැනීම සඳහා මුද්‍රාතබන ලද මිළ ගණන් 2026-03-17 වන දින පෙ.ව.10.30ට පෙර **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ටවර් හෝල් රඟහල පදනම, සව්සිරිපාය, අංක-123, විජේරාම මාවත, කොළඹ-07.** යන ලිපිනයේ පිහිටි ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් බහාලනයට අතින් ගෙවිත් හෝ එදින පෙ.ව.10.30ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. ප්‍රමාද වී ලැබෙන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු විවෘත කරන අවස්ථාව සඳහා ලංසු කරුට හෝ ඔහුගේ බලය ලත් අයෙකුට සහභාගී විය හැකිය. මිල ගණන් වලංගු කාලය දින 60ක් වන අතර මෙම ඡායාරූප ලබා ගැනීම පිළිබඳ විශේෂ පළපුරුද්දක් තිබිය යුතුය.

මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "**<u>ඡායාරූප ලබා ගැනීම සඳහා මිළ ගණන්</u>**" ලෙස සඳහන් කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

නිපුණ දිසානායක
අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)

දු.ක. - 0112682132
ෆැක්ස් අංකය - 0112678517
විද්‍යුත් තැපැල - towersl@sltnet.lk

**නිපුණ දිසානායක**
අධ්‍යක්ෂ(පාලන හා සංවර්ධන)